**ඔස්ට්‍රේලියානු මහකොමසාරිස් කාර්යාලය**
**කොළඹ**

**24** නොවැම්බර් 2014

## කාන්තාවන්ට එරෙහි හිංසනය පිටුදැකීමට අත්වැල් බැඳ ගනිමු.

**රොබින් මූඩි - ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස්**

කාන්තාවන්ට එරෙහි හිංසනය පිටුදැකීමේ ජාත්‍යන්තර දිනයේ දී, ඔස්ට්‍රේලියාවේ, පැසිෆික් කලාපයේ, ඉන්දියානු සාගර කලාපීය රටවල මෙන්ම ඉන් එපිට ඇති දේශයන්හි දී ද සෑම දිනක දීම කාන්තාවන්ට එරෙහි ව සිදු වන බිහිසුණු ප්‍රචණ්ඩත්වය මුදා හැරීමේ සිද්ධි සිහිපත් කරන්නට කැමැත්තෙමු.

මානව හිමිකම් උල්ලංඝනය කිරීම් අතර කාන්තාවන්ට එරෙහිව ක්‍රියාත්මක වන හිංසනය වඩාත් දරුණුම සහ පැතුරුණු ස්වභාවයකින් ක්‍රියාත්මක වේ.
සෑම රටකම පාහේ කාන්තා හිංසනය මැඩලීම සඳහා යහපත් ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබුණ ද, කාන්තා  හිංසනය සම්බන්ධයෙන් ලැබෙන සංඛ්‍යා දත්ත කනගාටුදායක තත්ත්වයක පවතී. එක් එක් පුද්ගලයන්ගේ ජීවිත කෙරෙහි මෙන්ම ප්‍රජාවන්ගේ යහපැවැත්ම කෙරෙහි ඉන් අහිතකර බලපෑමක් එල්ල වේ.

ලෝක මට්ටමින් බැලූ විට සෑම කාන්තාවන් තුන් දෙනෙකුගෙන් එක් අයෙකුට වැඩි පිරිසක් පහර දීමට ලක් වීම, බලහත්කාරයෙන් ලිංගික ක්‍රියාවන්ට යොමු කිරීම හෝ වෙනත් කිසියම් ආකාරයකින් අපයෝජනයකට ලක්වීම සිදු වී ඇත.  බොහෝ විට මෙවැනි අපයෝජනයක් සිදු ව ඇත්තේ එම කාන්තාවන් දන්නා හඳුනන පුද්ගලයන්ගෙනි. ඇතැම් විට සිය ස්වාමි පුරුෂයාගෙන් හෝ පවුලේ වෙනත් පිරිමි සාමාජිකයෙකුගෙන් මෙවැනි බලපෑමක් ඔවුනට එල්ල වීමට පුළුවන. පැසිෆික් කලාපයේ ඇතැම් ප්‍රදේශවල සිදු කෙරෙන සමීක්ෂණ දත්ත අනුව එම කාන්තාවන් තුන් දෙනෙකුගෙන් දෙදෙනෙකුට වැඩි පිරිසක්  හිංසනයන්ට ලක්ව ඇති බව පෙනී ගොස් තිබේ. ඔස්ට්‍රේලියාවේ සෑම සතියකට ම වරක් තමන්ගේ වත්මන් සහකරුවා හෝ පැරණි සහකරුවා අතින් එක් කාන්තාවක් ඝාතනයට ලක් වේ.

කාන්තාවන්ට සහ ඔවුන්ගේ දරුවන්ට සිදුවන හිංසනය අවම කිරීම සඳහා වූ ඔස්ට්‍රේලියානු ජාතික කවුන්සිලය වාර්තා කළේ 2009 වසරේ දී කාන්තාවන්ට සහ දරුවන්ට එරෙහි ව සිදු වූ හිංසනයන් තුළින් ඔස්ට්‍රේලියාවේ ආර්ථිකයට සිදු වූ බලපෑම ඔස්ට්‍රේලියානු ඩොලර් බිලියන 13.6 ක බවයි. නිසි ක්‍රියාමාර්ග නොගතහොත් 2021-22 වසර වන විට එම මුදල ඔස්ට්‍රේලියානු ඩොලර් බිලියන 15.6ක් දක්වා ඉහළ යා හැකි බව ද එම වාර්තාව කියා සිටී.

මුලින්ම හිංසනයෙන් බලපෑමට ලක් වන පිරිස කාන්තාවන් වන අතර ඔවුන් ගේ දරුවන්, පවුල මෙන් ප්‍රජාවන්ට ද අවසානයේ දී එම අයහපත් බලපෑම එල්ල වේ. එසේම, ජාතික ආර්ථිකයට එය බලපෑමක් වන අතර අපේක්ෂා කරන තිරසාර සාමයක් සහ ස්ථාවර සංවර්ධනයක් අත්පත් කර ගැනීමේ ඉලක්කයට ද අහිතකර ලෙස බලපානු ඇත.

අන්තර් ජාතික වශයෙන් ලැබුණු සාක්ෂි අනුව පෙනී යන්නේ කාන්තාවන්ට සහ ඔවුන්ගේ දරුවන්ට එරෙහි ව සිදු වන හිංසනය පිටු දැකීම සඳහා අවශ්‍ය වෙනස ඇති කර ගැනීමට අපට හැකි වන බවයි. මෙවැනි හිංසනයන් තවදුරටත් පවත්වා ගෙන යන, සාධාරණීකරණය කෙරෙන, ඊට ඉඩ සලසන සහ ඒවාට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම වළක්වන ආකල්ප සහ චර්යාවන් හඳුනා ගැනීම සඳහා මෙහිදී අප කටයුතු කළ යුතුය.

*දෙවැනි ක්‍රියාකාරී සැලැස්ම : 2013-16 ඉදිරි ගමන මැයෙන්* ඔස්ට්‍රේලියාව විසින් මෑතක දී ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කරනු ලැබූ අතර එහි අරමුණ වූයේ කාන්තාවන්ට සහ ඔවුන්ගේ දරුවන්ට

එරෙහි ව ක්‍රියාත්මක වන හිංසනයේ ප්‍රමාණය පැහැදිලි සහ තිරසායි ලෙස පහත හෙළීම සඳහා ඔස්ට්‍රේලියානු ප්‍රජාව පෙළ ගැස්වීමයි. දෙවැනි ක්‍රියාකාරී සැලැස්ම තුළ දී සංස්කෘතික වෙනසක් තවදුරටත් සිදු වනු ඇතැයි අප අපේක්ෂා කරන අතර ඒ ඔස්සේ කාන්තාවන් තමන්ට මුහුණ පෑමට සිදු වන අභාග්‍ය සම්පන්න සිද්ධි පිළිබඳ වාර්තා කිරීමට වැඩි නැඹුරුවක් ඇති කර ගනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. එසේම, ඔස්ට්‍රේලියානු ප්‍රජාවේ වැඩි සාමාජිකයන් පිරිසක් සක්‍රීය ලෙස හිංසනය පිටු දැකීම සඳහා කටයුතු කරනු ඇතැයි ද බලාපොරොත්තු වේ.

කාන්තාවන්ට එරෙහි හිංසනය යන සංසිද්ධිය ලොව පුරා කාන්තාවන්ට සහ ගැහැනු දරුවන්ට ඉතා අහිතකර ලෙස බලපාන බව අවබෝධ කර ගනිමින් ඔවුනට එරෙහි හිංසනය පිටු දැකීම සඳහා ලොව වෙනත් රටවලට ද සහාය දැක්වීමට සහ හවුල් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ඔස්ට්‍රේලියාව කැප වී සිටී.

මේ වසරේ මුල් භාගයේ දී ඔස්ට්‍රේලියාව විසින් ඔස්ටේලියානු ඩොලර් මිලියන 20ක සිව් අවුරුදු වැඩසටහනක් ක්‍රියාවට නැංවූ අතර එහි අරමුණ වූයේ ටිමෝර්-ලෙස්ටේහි කාන්තාවන්ට එරෙහි හිංසනය පිටු දැකීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සහ සහායක සේවා ක්‍රියාත්මක කරමින් හිංසනය ඇති වීමට හේතු වන කරුණු සහ ඉන් ඇති වන ප්‍රතිඵල සඳහා ප්‍රතිකර්ම යෙදීමයි.

1984 වසරේ ආරම්භයේ සිට මේ දක්වා ෆීජි රාජ්‍යයේ කාන්තා ගැටලු පිළිබඳ මධ්‍යස්ථානය සඳහා ඔස්ට්‍රේලියාව ආධාර සපයා ඇති අතර එම ආධාර යටතේ අලුතින් ආධාර ලබා ගැනීම සඳහා පැමිණි කාන්තාවන් 35,000කටත් නැවත නැවත පිහිට ලබා ගත් තවත් කාන්තාවන් 41,000කටත් උපදේශන සහ වෙනත් උපකාරක සේවා සැපයීම සිදු වී ඇත.

2013 වසරේ සිට පාකිස්ථානයේ සහ ඇෆ්ගනිස්ථානයේ කාන්තාවන්ට සහ ගැහැනු දරුවන්ට එරෙහි ව සිදු වන හිංසනය පිටු දැකීම සඳහා 2013 වසරේ සිට ඔස්ට්‍රේලියානු ඩොලර් මිලියන 30ක මුදලක් අප විසින් ලබා දී තිබේ. කාන්තාවට සහ ඔවුන්ගේ දරුවන්ට උපකාරක සේවා සැපයීමට මෙන්ම කාන්තාවන්ට එරෙහි හිංසනය සඳහා ඉඩ සලසන ආකල්ප සහ චර්යාවන්ට එරෙහිව ක්‍රියාත්මක වීමට පිරිමින්, කාන්තාවන්, ආගමික සහ ප්‍රජා නායකයන් පෙළ ගැස්වීම සඳහා නව්‍ය ප්‍රවේශයන් සොයා ගැනීම සඳහා ද මෙම අරමුදල් යෙදවේ.

ගැටුම් පවතින අවස්ථාවල දී, හදිසි අවස්ථාවල දී සහ අර්බුද ඇති අවස්ථාවල කාන්තාවන් හිංසනයට මුහුණ දීමේ ප්‍රවණතාව ඉහළ වේ. ගැටුම් තුළ ලිංගික හිංසනය පිටුදැකීමේ මහා බ්‍රිතාන්‍ය වැඩසටහනේ කොටස්කාරියක බවට ඔස්ට්‍රේලියාවේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරිය පත්වීම ද මෙයට හේතුවකි. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය තුළ කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රය පෙරමුණට ගෙන ඒම සඳහා ඔස්ට්‍රේලියාව සක්‍රීය ලෙස කටයුතු කිරීම ද ඊට තවත් හේතුවක් විය.

මේ වසරේ ඔක්තෝබර් මාසයේ දීකාන්තාවන්, සාමය සහ ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ ආරම්භක විවාදයට ඔස්ට්‍රේලියානු තානාපතිනිය වන නටාෂා ස්ටොට් ඩෙස්පෝජා මහත්මිය සහභාගී වූ අතර ගැටුම් හේතුවෙන් කාන්තාවන් සහ ගැහැනු දරුවන් අවතැන්වීමේ අවදානම පිළිබඳ විශේෂ අවධානයක් ද යොමු කළාය. එසේම, ගැටුම් තුළ දීඇති වන ලිංගික හිංසනය පිටුදැකීම සඳහා වන වැඩපිළිවෙළක් වෙනුවෙන් ඇය හඬ නැගුවාය.

කාන්තාවන්ට සිදුවන හිංසනයට එරෙහිව සෑම පුද්ගලයෙකුම, ප්‍රජාවක්ම සහ ආණ්ඩුවක්ම හඬක් නැගීමේ වගකීමක් ඇත. අපගේ සේවා ස්ථානවල, පාසල්වල, විශ්වවිද්‍යාලවල මෙන්ම අපගේ ප්‍රජාවන් තුළ සහ නිවෙස්වල කාන්තාවන්ට එරෙහි හිංසනයට නැවතුම් තිත තැබීමේ පණිවුඩය දීමට අප සියලු දෙනා යොමු විය යුතුය.
සුදු රිබන් පටි තානාපතිවරයෙකු බවට පත් වෙමින් ඔස්ට්‍රේලියානු අගමැතිවරයා මනා ආදර්ශයක් ලබා දීතිබේ. ඔස්ට්‍රේලියාවේ ප්‍රධානම පුරවැසියාව වශයෙන් කාන්තාවන්ට එරෙහි හිංසනයට කිසිදු අනුකම්පාවක් නොලැබෙන බව අගමැති ඇබොට් මහතා පැහැදිලි ලෙස පෙන්වා දී තිබේ.

ලොව පුරා වඩාත් ශක්තිමත් සහ තිරසාර වෙනසක් ඇති කර ගැනීමට අපගේ උත්සාහයට හැකි විය යුතු අතර එයින් හුදෙක් කාන්තාවන්ට සහ ළමයින් පමණක් නොව අප සියලු දෙනාට ප්‍රතිලාභහිමි විය යුතුය.